" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-BD/02/FI/09(B)

ඔබේ අංකය / உமது இலக்கம் / Your No.

දිනය / திகதி / Date 2019.09. 17

**අයවැය චක්‍රලේඛ 03/2019**

සභා ලේකම්,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

බස්නාහිර පළාත.

**<u>පළාත් සභාවේ ධූර කාලය අවසන් වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම.</u>**

06 වන පළාත් සභාවේ ධූරකාලය 2019.04.21 දින අවසන් වීම නිසා පළාත් සභාවේ ධූරධාරීන්, අමාත්‍යවරුන්, ගරු මන්ත්‍රීවරුන් හා ඔවුන්ගේ කාර්යය මණ්ඩලය ඉවත්වීම හේතුවෙන් එම තනතුරුවල වැටුප්, දීමනා හා අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් පහත සඳහන් ශීර්ෂයන්හි 2019 වර්ෂයට වෙන්කළ ප්‍රතිපාදනයන්ගේ ඉතිරිවීම් සිදුවේ.

101 - බස්නාහිර පළාතේ පළාත් සභාව

104 - පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය.

105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය.

106 - කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය.

107 - මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය

108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

02. ඉහත සඳහන් ශීර්ෂයන්ගේ පළමු ව්‍යාපෘතිය යටතේ දක්වා ඇති සියලුම වැය විෂයයන්හි ඉතිරිවීම් වැටුප් හා වේතන ගෙවීමකට හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2019 අනුව ගෙවනු ලබන රු.2,500/-ක දීමනාව ගෙවීම සඳහා වන මාරු කිරීමකට හැර එම ව්‍යාපෘතියේම වෙනත් වැය විෂයයකට හෝ එම ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම අවුරා තබන බව කාරුණිකව දන්වමි.

03. කෙසේ වෙතත් යම්කිසි නොවැළැක්විය හැකි අත්‍යවශ්‍ය කරුණක් වෙනුවෙන් ශීර්ෂය යටතේ පවතින වෙනත් ව්‍යාපෘතිවල වියදම් දැරීම සඳහා මාරු කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීමට අපේක්ෂා කෙරේ නම් ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව වැඩිදුරටත් දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් - 1. විගණකාධිපති - කරු. දැ.ගැ.ස
2. තොරතුරු තාක්ෂණ නිලධාරී - වෙබ් අඩවියේ පළ කිරීම සඳහා